**පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී හා එහි පරිපාලිත - 2022/2023**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය**

පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී(“සමාගම”) සහ සමාගමේ හා එහි පරිපාලිත සමාගම්වල (“සමූහය“) 2023 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ලාභ හා අලාභ ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වලින් සමන්විත 2023 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, සමූහයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මෙම විගණනය සඳහා ප්‍රසිද්ධ වෘත්තියෙහි යෙදී සිටින වරලත් ගණකාධිකාරී සමාගමක සහය මා ලබා ගන්නා ලදි.

සමාගමේ හා සමූහයේ 2023 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම හා සමූහය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම හා සමූහය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩපැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ හා සමූහයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ හා සමූහයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ හා සමූහයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

1.4 **විගණන විෂය පථය**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මඟින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- යම්අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව සමාගම ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව සමාගම කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (i) ප්‍රතිව්‍යුහගත, ප්‍රතිලේඛිත හා ප්‍රතිමූල්‍ය ණය පහසුකම්වල සමස්ත කාලය පද්ධතිය මඟින් හඳුනා නොගනී. | මූල්‍ය දෙපාර්තුමේන්තුව අභ්‍යන්තරව භාවිතා කරන වැදගත් වාර්තාවලින් එක් වාර්තාවක් වන “මාස අවසාන වාර්තාව” තුල දැනට මෙම සමස්ත කාලය පිළිබඳ දත්ත ඇතුළත් නොවේ. මූල්‍ය දෙපාර්තුමේන්තුව විසින් “සමස්ත කාලය ව්‍යුත්පන්න කිරීම සඳහා වන අයකිරීම් | මාස අවසාන වාර්තාව මඟින් සමස්ත කාලය හඳුනා ගැනීම සඳහා අවශ්‍ය පරිදි පද්ධතියේ වෙනස්කම් කිරීමට යෝජනා කෙරේ. |

| | | |
|---|---|---|
| | වාර්තාව" නමින් වෙනම වාර්තාවක් මත රැඳෙමින් කටයුතු කරන බැවින් සමස්ත කාලය පිළිබඳ අගයන් මාස අවසාන වාර්තාවට ඇතුළත් කිරීම සඳහා සමාගමට දැඩි අවශ්‍යතාවයක් වර්තමානයේදී පැන නැගී නොමැත. කෙසේ වුවද, බාහිර විගණකවරුන්ගේ අවශ්‍යතාවයන්ට අනුකූලව කටයුතු කිරීම සඳහා විධිමත් ඉල්ලීමක් තොරතුරු තාක්ෂණ දෙපාර්තුමේන්තුව වෙත මේ වන විටත් සිදු කර ඇත. | |
| (ii) සමාගමේ ප්‍රවර්තන පරිචයට අනුව, ණය හානිකරණ අලාභ වෙන් කිරීම අත්හුරු ක්‍රමයට සිදු කරයි. මෙම ක්‍රියාවලිය සඳහා අවශ්‍ය දත්ත ජනනය කිරීමට කළමනාකාරීත්වය විසින් අභ්‍යන්තර වාර්තා රාශියක් සම්පාදනය කරයි.<br>උදාහරණයක් ලෙස කල් පසු වූ දින ගණන, ණය පහසුකම්වල කල්පිරෙන දිනය, පළමු ගෙවීම් පැහැර හරින දිනය, පරීක්ෂා කළයුතු ගණුදෙනුකරුවන්, ප්‍රතිව්‍යුහගතකරණය කරන ලද ගණුදෙනුකරුවන් පිළිබඳ තොරතුරු ලබා ගැනීමේදී කළමනාකාරීත්වය සතුව තනි මූලාශ්‍රයක් නොමැති බැවින්, පද්ධති වාර්තා කිහිපයක් තොරතුරු ලබා ගැනීම සඳහා යොදා ගනී. තවද, අත්හුරු ක්‍රමය බහුලව භාවිතා කිරීම සහ වාර්තා රාශියක් තනි ස්ථානයකට සම්පිණ්ඩනය කිරීම තුළ මහහැරීම, සාවද්‍ය ප්‍රකාශයන් හා මානව වැරදි ඇති වීමට හේතු විය හැක. | තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව සමඟ ඒකාබද්ධව, LGD, PD සහ EAD ගණනය කිරීම් පද්ධතිය ආශ්‍රයෙන් සිදු කිරීම අප විසින් සාර්ථකව අවසන් කර ඇත. නමුත්, ආකෘතිවල අඛණ්ඩ වැඩිදියුණු කිරීම් සහ කළමනාකාරීත්ව ගැලපුම් හේතුවෙන් ඇතැම් ගණනය කිරීම් පද්ධතියේ ශක්‍යතාවයන්ට පරිබාහිරව පවතී. ණය සහන වලට අදාලව නව්‍යකරණයන්, බාහිර විගණන ක්‍රියාපටිපාටි වලට අදාල සංශෝධනයන් ක්‍රියාත්මක කිරීමට අදාල නව්‍යකරණයන් සහ ආර්ථික වෙනස්කම් වලට අදාල නව්‍යකරණයන් මේ තුළ ඇතුළත් වේ. එසේ වුවද, ණය හානිකරණ අලාභ ගණනය කිරීම පද්ධතිය පදනම් කරගත් ප්‍රවේශයක් හරහා සිදුකිරීමට සමාගම ක්‍රියාකාරීව කටයුතු කරමින් සිටී. | මෙම ක්‍රියාවලිය ස්වයංක්‍රීයව සිදු කිරීමට අවශ්‍ය පියවර ගැනීමටත්, දත්ත හැසිරවීමේ සහ මහහැරීමේ අවදානම වළක්වා ගැනීම සඳහා අත්හුරු ක්‍රමයට යොමු වීම අවම කළ යුතු බවට යෝජනා කෙරේ. මීට අමතරව, විවිධ මූලාශ්‍රවලින් දත්ත උපුටා ගැනීම, එම දත්ත සම්පිණ්ඩනය කිරීම සහ Excel වැඩ පත්‍රිකා මත රඳාපැවැත්ම සඳහා ගතවන කාලය ඉතිරි කර ගැනීමට හැකි වනු ඇත. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

| නීති,රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) ශ්‍රී ලංකා මහ බැංකුව (CBSL) විසින් නිකුත් කරන ලද 2021 අංක 05 දරණ නියමයෙහි (යහ පාලනය) අංක 10.3.j.vii වගන්තිය | අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (BIRMC) විසින් මණ්ඩලයේ මතය එකඟතාව සහ/ හෝ | එකඟවේ. අවදානම් තක්සේරු වාර්තාව මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග සම්පාදනය කරමු. | නියමයේ සඳහන් පරිදි අවදානම් තක්සේරු වාර්තාවක් අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ |

| | | |
|---|---|---|
| | නිශ්චිත මහපෙන්වීම් විමසීම සඳහා අවදානම් තක්සේරු වාර්තාවක් එළඹෙන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට ඉදිරිපත් කළ යුතුය. නමුත්, අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු (BIRMC) වාර්තාව මීලඟ මණ්ඩල රැස්වීම සඳහා ඉදිරිපත් කිරීම සමාගමේ වර්තමාන පරිචය වෙයි. | කමිටුව (BIRMC) විසින් අධ්‍යක්ෂ මණ්ඩලයේ මතය, එකඟතාවය සහ/හෝ නිර්දේශයන් විමසීම් සඳහා ඉදිරි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම සඳහා ඉදිරිපත් කිරීම සිදුකළ යුතුය. |

## 1.7 තොරතුරු තාක්ෂණ පොදු පාලන ක්‍රම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශ |
|---|---|---|
| (i) තෝරාගත් නියැදියට අනුව, ඉවත්ව ගිය සේවකයන්ගේ පරිශීලක ගිණුම් InBank සහ Microfin පද්ධතියෙන් කාලානුරූපව අක්‍රීය කර නොමැත. ඉවත්ව ගිය සේවකයන්ගේ පරිශීලක ගිණුම් කාලානුරූපව අක්‍රිය කිරීම සඳහා ප්‍රමාණවත් ක්‍රියාමාර්ග නොගැනීම තුල ව්‍යාපාර ගනුදෙනු සඳහා වගකීම් පැවරීමේදී සැලකිය යුතු ගැටළු පැන නැඟිය හැක. උදාහරණයක් ලෙස, ඉවත්ව ගිය සේවකයකුගේ පරිශීලක ගිණුමක් තුලින් ප්‍රවර්තන පරිශීලකයෙකුට පද්ධතියෙහි වංචනික ගනුදෙනු සිදු කිරීම සඳහා භාවිතා කළ හැකිය. නමුත්, ඔහු/ඇය වෙනත් අයෙකුගේ පරිශීලක ගිණුමක් එම ගනුදෙනුව සඳහා භාවිතා කරන බැවින් ඔහු/ඇයට එම ගනුදෙනුව සඳහා වගකීමක් පැවරිය නොහැක. | ප්‍රමාද වූ අවස්ථා 28 ක් අතුරෙන්, ප්‍රවේශ ඒකකයේ සිදු වූ ප්‍රමාදය හේතුවෙන් පරිශීලකයින් 3ක් (404204, 404638, 30720) පමණක් ප්‍රමාද වී ඇත. පසුගිය වසරේ ස්වයංක්‍රීය අක්‍රිය කිරීමේ තිරයේ ඇති වූ දෝෂයක් මෙයට හේතු වූ අතර එම නිසා ප්‍රවේශ ඒකකය අතහුරු ක්‍රමයට අක්‍රීය කිරීම් සිදු කර ඇත. මෙය 2023 මාර්තු සිට නිවැරදි කර ඇත.<br>අනෙකුත් සියලුම ප්‍රමාද වූ අක්‍රිය කිරීම් 25 මානව සම්පත් අංශය මඟින් ප්‍රවේශ ඒකකය වෙත ඉල්ලා අස්වීම් පිළබඳ දැනුම් දීම ප්‍රමාදවීම හේතුවෙන් සිදුව ඇත. | සේවයෙන් ඉවත් වූ සේවකයන්ගේ ප්‍රවේශ ගිණුම් අනිසි ලෙස පරිහරණය කිරීමේ අවදානම අවම කිරීම සඳහා එම ගිණුම් ප්‍රවේශයන් සංවිධානයේ යෙදවුම් පද්ධතියෙන් කඩිනමින් ඉවත් කිරීම වැදගත් වේ. ඉවත් වූ සේවකයින්ගේ පරිශීලක ගිණුම් ඔවුන්ගේ ඉල්ලා අස්වන දිනයේ ව්‍යාපාරික දිනය අවසානයේ අක්‍රිය කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය බදු ගෙවීමට පෙර ලාභය රු. මිලියන 4,342 ක් වූ අතර ඊට අනුරූප පෙර වසරේ ලාභය රු. මිලියන 6,650 ක් විය. ඒ අනුව, මූල්‍ය ප්‍රතිඵලයේ රු. මිලියන 2,308 ක පිරිහීමක් නිරීක්ෂණය විය. රු. මිලියන 6,315 කින් පොලී ආදායම ඉහළ ගොස් පැවැතියත්, පොලී වියදම් සහ පුද්ගලික වියදම් පිළිවෙලින් රු. මිලියන 7,375 ක් සහ රු. මිලියන 486කින් ඉහළ යාම හා ගාස්තු සහ කොමිස් ආදායම සහ අනෙකුත් මෙහෙයුම් ආදායම රු. මිලියන 611 ක් සහ පිළිවෙලින් රු.මිලියන 409 කින් පහළ යාම මෙම පිරිහීමට හේතු වී ඇත.

### 2.2. ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

2.2.1 සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂ හතරක සමාගමේ මූල්‍ය ප්‍රතිඵලවල සාරාංශයක් පහත වගුවේ දැක්වේ.

| වර්ෂය | 2022/2023 | 2021/2022 | 2020/2021 | 2019/2020 | 2018/2019 |
|---|---|---|---|---|---|
| පොලී ආදායම (රු. මිලියන) | 30,197 | 23,881 | 24,983 | 31,459 | 30,836 |
| ඉකුත් වර්ෂයට සාපේක්ෂව වැඩිවීම/ (අඩුවීම) (%) | 26.45 | (4.41) | (20.58) | 2.02 | - |
| පොලී වියදම් (රු. මිලියන) | 18,207 | 10,832 | 13,064 | 15,787 | 15,646 |
| ඉකුත් වර්ෂයට සාපේක්ෂව වැඩිවීම/ (අඩුවීම) (%) | 68.08 | (17.09) | (17.24) | 0.90 | - |
| බදු පෙර ලාභය (රු. මිලියන) | 4,342 | 6,650 | 5,873 | 4,552 | 6,585 |
| ඉකුත් වර්ෂයට සාපේක්ෂව වැඩිවීම/ (අඩුවීම) (%) | (34.71) | 13.23 | 29.02 | (30.87) | - |

**2.2.2** සමාලෝචිත වර්ෂයේ ප්‍රධාන ආදායම් හා වියදම් අයිතමවල විශ්ලේෂණයක් පසුගිය වර්ෂය සමඟ සසඳා, වැඩිවීමේ හෝ අඩුවීමේ ප්‍රතිශතයන් සහිතව පහත වගුවේ දැක්වේ.

| විස්තරය | විචලනය වැඩිවීම / (අඩු වීම) (රු.000) | විචලනය % | විචලනය සඳහා හේතුව |
|---|---|---|---|
| පොලී වියදම | 7,374,757 | 68.08 | 2021/22 මූල්‍ය වර්ෂයේ වාර්තා වූ අගයට සාපේක්ෂව පොලී වියදම් සියයට 68.08 කින් වැඩි වී ඇත. තැන්පත්කරුවන්ට ගෙවන ලද සහ උපචිත පොලී මුළු පොලී වියදමෙන් විශාලතම කොටස නියෝජනය කරන අතර පළමු මාස නවය තුළ වැඩි වූ ප්‍රතිපත්ති පොලී අනුපාතවලට සමගාමීව ස්ථාවර තැන්පතු කළඹ නිරන්තර නැවත මිල කිරීම, වත්මන් මූල්‍ය වර්ෂයේ පොලී වියදම් වැඩි වීමට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත. |
| පොලී ආදායම | 6,315,062 | 26.44 | සමාගමේ පොලී ආදායමේ වර්ධනයට වෙළඳපොළ පොලී අනුපාතවල තියුණු ඉහළයාම හේතු වූ අතර ස්ථාවර තැන්පතු සහ රාජ්‍ය සුරැකුම්පත්වල ආයෝජනවලින් සියයට 26.44ක පොලී ආදායමක් උත්පාදනය කරන ලදී. |
| ගාස්තු සහ කොමිස් ආදායම | (611,237) | (32.57) | අයහපත් ආර්ථික තත්ත්වයන් මධ්‍යයේ නව ව්‍යාපාර සඳහා ඇති ඉල්ලුම අඩු වීම හේතුවෙන් ණය ලබාදීම හා බැඳුණු ගාස්තු සහ කොමිස් ආදායම පෙර වසරට සාපේක්ෂව සැලකිය යුතු ලෙස අඩු වී ඇත. |

| | | | |
|---|---|---|---|
| සේවක වියදම් | 486,132 | 12.15 | වෙළඳපොල පොලී අනුපාත තියුණු ලෙස ඉහළ යාම මත ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත අංක 09 (SLFRS) ට අනුකූලව ගිණුම්කරණ සටහන් පැනවීම හේතුවෙන් සේවක පිරිවැය ප්‍රධාන වශයෙන් වැඩි වී ඇත. |
| අනෙකුත් මෙහෙයුම් ආදායම් | (409,257) | (42.78) | අනෙකුත් මෙහෙයුම් ආදායම්, ආයෝජන වලින් ලැබෙන ලාභාංශ ආදායම සහ දේපළ පිරියත උපකරණ විකිණීමෙන් ලැබෙන ලාභයෙන් ප්‍රධාන වශයෙන් සමන්විත වූ අතර, පරිපාලිත සමාගම්වලින් ලැබෙන ලාභාංශය රු. මිලියන 930.62 සිට රු. මිලියන 513.82 දක්වා අඩුවීම හේතුවෙන් මෙය සියයට 42.78 ක ප්‍රතිශතයකින් සැලකිය යුතු ලෙස පහත වැටී ඇත. |

**2.3. අනුපාත විශ්ලේෂණය**

ලබාගත හැකි වූ තොරතුරුවලට අනුව, සමාලෝචිත වර්ෂයේ හා පෙර වර්ෂයේ සමාගමේ සමහර වැදගත් අනුපාත, ශ්‍රී ලංකා මහබැංකුව විසින් ප්‍රකාශිත ආංශික අනුපාත සමඟ සසඳා පහත දැක්වේ.

| **විස්තරය** | **ආංශික අනුපාතය** | **සමාගම** | |
|---|---|---|---|
| | | **2022/2023** | **2021/2022** |
| කාර්යසාධන අනුපාත | | | |
| හිමිකම මත ප්‍රතිලාභය (ROE) | 8.95 | 7.68 | 12.74 |
| වත්කම් මත ප්‍රතිලාභය (ROA) | 3.00 | 2.47 | 3.85 |
| පොලී ආන්තිකය | 6.68 | 7.35 | 8.10 |
| වත්කම් ගුණාත්ව අනුපාතය | | | |
| දළ අක්‍රීය ණය අත්තිකාරම් (NPL) | 15.98 | 14.26 | 8.78 |
| ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාත | | | |
| ස්ථර 1 ප්‍රාග්ධනය (අවම 10%) | 20.50 | 25.76 | 18.76 |
| මුළු ප්‍රාග්ධනය (අවම 14%) | 21.86 | 26.61 | 19.67 |